# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2067/07 – 2018 අප්‍රේල් 17 වැනි අඟහරුවාදා – 2018.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටකෝට්ටේ (කොට්ඨාස අංක 6- පිටකෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව තුළ) නැමැති ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/කේට්ටී/2017/405 හා 2017.09.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1317 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ ' – මදටියගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1317**

උතුරට: තලවතුගොඩ පාරේ වරිපනම් අංක 163/3 දරන ඉඩම, සිමෙන්ති කානුව, නම සොයාගත නොහැකි ඉඩම; නැගෙනහිරට: නම සොයාගත නොහැකි ඉඩම, තලවතුගොඩ පාරේ වරිපනම් අංක 171/1 සහ 171/1/ඒ දරන ඉඩම්; දකුණට: තලවතුගොඩ පාරේ වරිපනම් අංක 171/1 සහ 171/1/ඒ දරන ඉඩම් සහ තලවතුගොඩ පාර; බටහිරට: තලවතුගොඩ පාර, පාර සහ තලවතුගොඩ පාරේ වරිපනම් අංක 163/3/ඒ දරන ඉඩම සහ සිමෙන්ති කාණුව.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/4/2017/ඩී/140.
2018 පෙබරවාරි මස 23 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

05-18

1A – G27482– 08 (2018/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*